BRITISH COUNCIL

# ගෝලීය ප්‍රතිපත්ති ප්‍රකාශය

## ළමා ආරක්ෂණය

බ්‍රිතාන්‍ය කවුන්සිලය යනු සංස්කෘතික සබඳතා සහ අධ්‍යාපනික අවස්ථාවන් සඳහා වන එක්සත් රාජධානියේ ජාත්‍යන්තර ආයතනයයි.

ළමා ආරක්ෂණයේ දී සියලුදෙනාම වගකීම ගත යුතු බවත්, සෑම දරුවකුම වටිනා බවත් අප විශ්වාස කරමු. දරුවන් රැකබලා ගැනීම, ආරක්ෂණය සහ සුභසාධනය අන් සියලු දෑ ට වඩා වැදගත් බව සහ, සියලු ආකාරයේ හානිවලින් ආරක්ෂණය වීමේ අයිතිය දරුවන් හට තිබෙන බව අප විසින් හඳුනාගෙන ඇත. දරුවන් සමඟ කටයුතු කෙරෙන හෝ ඔවුන් වෙත බලපෑමක් ඇති කෙරෙන අපගේ වැඩසටහන් සහ මෙහෙයුම්වලදී සියලු දරුවන් වෙත රැකවරණය ලබාදීමේ මූලික වගකීමක් අප සතුව ඇති බව ද අප විසින් හඳුනාගෙන ඇත. පහත දැක්වෙන කරුණුවල ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන හානි හෝ හානියක් සිදුවීමේ අවදානම හෝ සම්බන්ධයෙන් දරුවන් ආරක්ෂණය කිරීමේ වගකීම ද ඊට අයත් වේ:

- අප කාර්යමණ්ඩලය හෝ හවුල්කරුවන් විසින් සිදුකරන විෂමාචාර ක්‍රියා
- දුර්වල ප්‍රතිපත්ති
- අපගේ වැඩසටහන් සහ මෙහෙයුම් නිර්මාණය කිරීමේ හෝ ක්‍රියාවට නැංවීමේ දුර්වලතා

එක්සත් රාජධානියේ ළමා ආරක්ෂණ නීති සහ අපගේ මෙහෙයුම් කටයුතු සිදු කෙරෙන එක් එක් රටට අදාළ නීති අනුව කටයුතු කිරීම සහ 1989, ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCRC) හි 19 වැනි වගන්තිය අනුව කටයුතු කිරීම හරහා මෙය ළඟා කරගැනීමට අප අරමුණු කරමු.

දරුවකු ජීවත්වන රටෙහි හෝ ඔවුන්ගේ නේවාසික රටෙහි හෝ පූර්ණ වයස වශයෙන් සැලකෙන වයස කුමක් වුවත්, බ්‍රිතාන්‍ය කවුන්සිලය තුළ දරුවකු වශයෙන් අර්ථ දක්වනු ලබන්නේ, 18 වැනි උපන්දිනට (UNCRC 1989) පත් නොවූ ඕනෑම අයෙකි.

## බ්‍රිතාන්‍ය කවුන්සිලය, පහත කරුණු වෙත කැපවීමෙන් ක්‍රියා කරනු ලබයි:

- දරුවන් ඇගයීම, ගරු කිරීම සහ ඔවුන්ට සවන් දීම
- කාර්යමණ්ඩලය බඳවා ගැනීමේ දී අවශ්‍ය සියලු පිරික්සුම් කටයුතු සිදු කර ඇති බව සහතික කිරීම
- ළමා ආරක්ෂණය සම්බන්ධයෙන් කාර්යමණ්ඩලය සඳහා දැඩි ක්‍රමවේද සහ ක්‍රියාපටිපාටි පවත්වා ගැනීම
- සැලසුම් හා ප්‍රතිපත්ති වෙත දැනුම්දීම පිණිස ළමා ආරක්ෂණ ගැටලු පිළිබඳ පොදු අවබෝධයක් ලබාදෙමින් සිය කාර්යමණ්ඩලය පුහුණු කිරීම
- ළමා ආරක්ෂණය සහ මනා ප්‍රතිපත්ති පිළිබඳ තොරතුරු ළමුන් සහ දෙමාපියන්/රැකබලාගන්නන් සමඟ බෙදා-හදා ගැනීම
- කිසියම් කාරණයක් සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ තොරතුරු බෙදා-හදා ගැනීම සහ උචිත ආකාරයෙන් දෙමාපියන් හා ළමුන් ඊට සම්බන්ධ කරගැනීම
- පැහැදිලි ක්‍රියාපටිපාටි, අධීක්ෂණය සහ සහය හරහා කාර්යමණ්ඩලය වෙත වැඩදායී කළමනාකාරිත්වයක් ලබාදීම

මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමෙහි ලා ප්‍රමාණවත් හා උචිත සම්පත් අප විසින් සපයනු ඇති අතර, ඒවා නිසියාකාරයෙන් සන්නිවේදනය කළ බවට හා තේරුම්ගත් බවට ද සහතික කෙරෙනු ඇත.

නවතම නෛතික හා නියාමන වැඩිදියුණු කිරීම් පිළිබිඹු කිරීමට සහ නිසි පරිශීලනය සහතික කිරීම පිණිස මෙම ගෝලීය ප්‍රතිපත්ති ප්‍රකාශනය බ්‍රිතාන්‍ය කවුන්සිලය විසින් වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබේ.

